# කොළඹ දිසා අධිකරණයේදීය.

කේ. ටී. එමිලියා ලිලන්ති ද සිල්වා,
22, 2වන පටුමග ,
පැගිරිවත්ත පාර,
ගංගොඩවිල

පැමිණිලිකාරිය

නඩු අංකය ඃ

කාර්යය පටිපාටිය ඃ සාමාන්‍ය

ස්වභාවය ඃ විශේෂ

වටිනාකම ඃ රුපියල් මිලියන 50යි

\- එදිරිව

1. නීතිඥ රජීව් අමරසූරිය

අංක 8/2 ඒ, කොනිස්ටන් පෙදෙස, කොළඹ 07.

2. නීතිඥ ආචාර්ය සුනිල් අබේරත්න

අංක 36-1/B/09, නව නීතිඥ කාර්යාල සංකීර්ණය, ශාන්ත සෙබස්තියන් කන්ද, අලුත්කඩේ. කොළඹ 12.

3. ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ

අංක 195/21, රෝයල් කෝට්, කොස්වත්ත.

4. නීතිඥ චතුර ගල්හේන

ලේකම්,

ශ්‍රී ලංකා නීතිඥ සංගමය,

කොළඹ 12.



CamScanner

5. ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න,
නේවාසික භාර නිළධාරී,
ශ්‍රී ලංකා ජනරජයේ සොලිසිටර් ජෙනරාල් තුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

6. ජනාධිපති නීතිඥ හර්ෂ සෝසා
160/8, පොල්හේන්ගොඩ පාර කොළඹ 05

7. ජනාධිපති නීතිඥ උදිත ඉගලහේවා
402/2, කොටිකාවත්ත නව නගරය, මුල්ලේරියාව

8. ජනාධිපති නීතිඥ නෙවිල් අබේරත්න
137, නාගහවත්ත,
රද්දොලුගම, කැළණිය

9. ජනාධිපති නීතිඥ ආචාර්ය රොමේෂ් ද සිල්වා,
79/14, ආචාර්ය සි. ඩබ්. ඩබ්. කන්නන්ගර මාවත,
කොළඹ —07.

10. ජනාධිපති නීතිඥ ඉක්රාම් මොහොමඩ්
69/2 අනුලා පාර
කොළඹ 6

11. ජනාධිපති නීතිඥ ජෙෆ් අලගරත්නම්
7, ඩේසිවිලා ඇවනියු, ,
කොළඹ 04



CamScanner

12. ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස
30/5, 1/1, උද්‍යාන පාර,
කොළඹ 05
<u>වගඋත්තරකරුවන්</u>

වර්ෂ 2025 ක්වූ පෙබරවාරි මස 17 වන දින දීය.

මල්ලවාරච්චි ඇසෝසියේට්ස් නාමය විලාසය අභිධානය යටතේ නීතිඥ වෘත්තියේ යෙදී සිටින වරුණ නිලංජීව මල්ලවාරච්චි සහ ඔහුගේ සහයකයන් වන ගීතානි ඉනෝකා කාංචනමාලා කොඩිතුවක්කු සහ කොග්ගල පටබැඳිගේ මහේෂිකා උමයංගනී ද සිල්වා යන නීතිඥවරුන් මාර්ගයෙන් පෙනී සිටින ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය ස්වකීය <u>පැමිණිල්ලෙන්</u> මෙසේ ප්‍රකාශ කර සිටී.

1. ඉහත නම් සඳහන් 1 වන සහ 3 වන වගඋත්තරකරුවන් පදිංචිව සිටින්නේද, මින්මතු විස්තර කරනු ලබන නඩු නිමිත්ත හටගෙන ඇත්තේද, මෙම අධිකරණයේ අධිකරණ බල සීමාව තුළදී වන බැවින් මෙම නඩුව අසා සුදුස්සක් කිරීම සඳහා මෙම ගරු අධිකරණයට අධිකරණ බලය ඇති බව ප්‍රකාශකර සිටී.

<u>පැමිණිලිකරු සහ වගඋත්තරකරුවන්</u>

2. පැමිණිලිකාරිය වර්ෂ 1993 සිට ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් ලෙස වෘත්තියෙහි යෙදී සිටින බවත්, ඇය ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ යාවජීව සාමාජිකාවක් බවත්, එම සංගමයේ කාර්යශීලී සාමාජිකාවක් බවත්, පැමිණිලිකාරිය වසර 32 ක නීතිඥ වෘත්තියේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨ නීතිඥවරියක් බවත්, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නීතිඥ සභාවේ සාමාජිකාවක් ද වූ බවත්, මෙම පැමිණිල්ල පැමිණිලිකාරිය වෙනුවෙන් සහ සමස්ථ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සමස්ථ සාමාජිකයින් වෙනුවෙන් ඉදිරිපත්කර සිටින බවද පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

*නීතිඥ සංගමය විසින් පැමිණිලිකාරිය ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ යාවජීව සාමාජිකයෙකු වන බවට තහවරු කරමින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති වර්ෂ 2025/02/14 දින දරන ලිපියේ සත්‍ය පිටපතක් ''A '' ලෙස ලකුණු කර මෙහි කොටසක් ලෙස මේ සමග ඉදිරිපත් කර සිටී.*

3. නීතිඥ සංගමයේ සභාපතිවරයා ලෙස පත්වන නීතිඥවරයා නීතිඥ ප්‍රජාවේ තත් කාලයේ නායකයා ලෙස නීතිඥ ප්‍රජාව වෙනුවෙන් කටයුතු කරන සහ වගකිව යුතු නීතිඥවරයා වන බවත්, වසරින් වසර, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ව්‍යවස්ථාව අනුව සභාපතිවරයකු ශ්‍රී ලංකාව පුරා සිටින නීතිඥවරුන් විසින් නිළවරණයක් මගින් තෝරා පත් කර ගන්නා බවත්,



CamScanner

එකී නිලවරණයන්හිදී ශ්‍රී ලංකා ජනරජයේ සොලිසිටර් ජෙනරාල්වරයා, තේරීම් භාර නිලධාරියා ලෙස කටයුතු කරන බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

4. වර්ෂ 2025/2026 සඳහා මෙම සංගමයේ සභාපතිවරයෙකු තේරීම සඳහා වර්ෂ 2025 ක්වූ පෙබරවාරි මස 19 වන දින පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිලවරණයේ දී පැමිණිලිකාරිය ඡන්දය භාවිතා කිරීමට හිමිකම් ඇති නීතිඥවරියක් වන බවත්, ඇය වෙත *ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් නිකුත් කර ඇති නිලවරණ පත්‍රිකාවේ (Polling Card) සත්‍ය පිටපතක් "**B**" ලෙස ලකුණු කර මෙහි කොටසක් ලෙස ඉදිරිපත් කර සිටි.*

5. ඉහත නම් සඳහන් 6, 7, 8 වන විත්තිකරුවන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ මැතිවරණ කටයුතු සම්බන්ධයෙන් පත් කර ඇති උපදේශක මණ්ඩලයේ සාමාජිකයන් වන බවත් (Advisory Board) මෙම විත්තිකරුවන් මෙම නඩුවෙහි අධිකරණය විසින් විසඳිය යුතු සියලු ප්‍රශ්න සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය පාර්ශවකරුවන් වන බවත්, එම නිසා මෙම විත්තිකරුවන් මෙම නඩුවේ පාර්ශවකරුවන් කර ඇති බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

6. ඉහත නම් සඳහන් 9, 10, 11 සහ 12 විත්තිකරුවන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයට මහඟු සේවාවක් කළ සභාපතිවරුන්ව සිටි විශිෂ්ට සහ කීර්තිමත් ජනාධිපති නීතිඥවරුන් බවත් ජනාධිපති නීතිඥවරුන් මෙම නඩුවේ විසඳීමට ඇති නීතිඥ ප්‍රජාව කෙරෙහි බලපාන සියලු ප්‍රශ්න ගරු අධිකරණයේ විසඳීම වස් මෙම නඩුවෙහි පෙනී සිටිය යුතු පුද්ගලයන් බවත් මෙකී කරුණු අනුව එකී 9, 10, 11 සහ 12 විත්තිකරුවන් මෙම නඩුවෙහි පාර්ශවකරුවන් කර ඇති බවත් පැමිණිකාරිය ප්‍රකාශ කර සිටි.

<u>ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති ධූරය සඳහා තෝරාපත් කර ගැනීමට අදාළ ව්‍යවස්ථානුකුල සහ සාම්ප්‍රදායනුකුල සුදුසුකම්</u>

7. ශ්‍රී ලංකාවෙහි නීතිඥවරුන්ගේ ප්‍රධාන වෘත්තීය සංගමය වන කොළඹ 12, මිහිදු මාවතේ, අංක 153 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ වර්ථමාන සාමාජිකයන්ගේ සංඛ්‍යාව 21,000 කට අධික බවත්, *එම සංගමයේ ව්‍යවස්ථාවේ සත්‍ය පිටපතක් "**C**" ලෙස ලකුණු කර මෙහි කොටසක් ලෙස ඉදිරිපත් කර සිටින බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටි.*

8. මෙම සංගමය වර්ෂ 1974 සිට දැනට වසර 50 ක් තිස්සේ ක්‍රියාතමක්ව පවතින සංගමයක් වන අතර, එහි සභාපති ධූරය වර්ෂ 2024 දක්වා දරන ලද්දේ ශ්‍රී ලංකාවෙහි නීති වෘත්තියෙහි විශිෂ්ඨත්වයට පත්, ජ්‍යේශ්ඨ නීතිඥ හෝ ජනාධිපති නිතිඥවරුන් විසින් බවත්, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටි. එසේ මෙම සංගමයේ සභාපතිධූරය දැරූ ප්‍රසිද්ධ සහ ජෙෂ්ඨ නීතිඥවරුන් අතරින් කැපී පෙනෙන සමහර සභාපති වරුන් වූයේ රාජ නීතිඥ

ආචාර්ය එච්. ඩබ්ලිව්. ජයවර්ධන, රාජ නීතිඥ ඒ. සී. ගුණරත්න, ජනාධිපති නීතිඥ එච්. එල්. ද. සිල්වා, ජනාධිපති නීතිඥ ඒ. සී. ද සොයිසා සහ ජනාධිපති නීතිඥ ආචාර්ය රොමේෂ් ද සිල්වා යන මහත්වරුන් වේ.

**9.** මෙම සංගමයේ වර්ෂ 2025-02-19 වන දිනට නියමිත නිළවරණයට අදාළව මෙම නඩුව පවරන බවත්, මෙම සංගමය සංස්ථාපිත කර ඇති සංගමයක් නොවන බවත්, සාමාජිකයන් 21,000 කට වැඩි සංඛ්‍යාවකින් යුත් ශ්‍රී ලංකාව පුරා නීතිඥ වෘත්තියෙහි යෙදී සිටින සාමාජිකයන්ගෙන් සමන්විත බවත්, එකී සියලු සාමාජිකයන් මෙම නඩුවෙහි පාර්ශවකරුවන් කිරීම ප්‍රායෝගික නොවන බවත්, එකී සියලුම සාමාජිකයන් පොදු අරමුණකින් ක්‍රියා කරන සාමාජිකයන් වන බවත්, එම නිසා මෙම නඩුවෙහි පාර්ශවකරුවන් කර නොමැති අනෙකුත් සියලු සාමාජිකයන් සහ මෙම සංගමයේ විධායක සභාවේ සියලුම සාමාජියන් ඇතුලු ශාඛා සංගම් සියලු අය නියෝජනය කිරීම සඳහා මෙම සංගමයේ වර්ථමාන ලේකම් වන ඉහත සඳහන් 4 වන විත්තිකරු සිවිල් නඩු විධාන සංග්‍රහයේ 16 වන වගන්තිය යටතේ පත් කිරීමට අවශ්‍ය බවත්, සහ එසේ පත් කරන ලෙසත්, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

**10.** අනෙකුත් කරුණු අතර, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ මූලික පරමාර්ථය වනුයේ නීතිඥ සංගමයේ ස්වාධීනත්වය සහ ගරුත්වය ආරක්ෂා කිරීම ද, නීතිඥවරුන්ගේ අයිතිවාසිකම් වරප්‍රසාද සහ සුභසාධනය ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ගෞරවාන්විත වෘත්තිය ක්‍රියා කලාපයන් වර්ධනය කර, වෘත්තිමය අක්‍රමිකතා නැතිකර නීතිඥවරුන්ගේ ගරුත්වයට හානිකර හැසිරීම සහ ක්‍රියා කලාපයන් යටපත් කර නීතිඥවරුන්ගේ යහපැවැත්ම ස්ථාපනය කිරීමට කටයුතු කිරීම ද වේ.

**11.** මෙම සංගමයේ එකී උසස් අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා නීතිඥ වෘත්තියේ විශිෂ්ඨත්වයට පත් සහ ජ්‍යේෂ්ඨ නීතිඥවරයෙකු එම සංගමයේ සභාපති කර ගැනීම අත්‍යවශ්‍ය බවත්, මෙම අවශ්‍යතාවය ඉහත නම් සඳහන් මෙම සංගමයේ සිටි සභාපතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සහ වෘත්තීය විශිෂ්ඨත්වය සලකා බැලීමේදී මනාව තහවුරු වන බවත්, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

**12.** නීතිඥ සංගමයේ සභාපති ධූරය සඳහා විවිධ නීතිඥවරුන් නාම යෝජනා ඉදිරිපත් කිරීමෙහිදී ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය, වෘත්තිමය විශිෂ්ඨත්වය (Seniority & Eminace) මෙන්ම අනෙකුත් දේ අතර, ඔවුන්ට නීතිඥ වෘත්තියේ සහ සංගමයේ ස්වාධීනත්වය කෙතරම් දුරට ආරක්ෂා කළ හැකිද සහ/හෝ ඔවුනට විරුද්ධව නීති වෘත්තියෙහි විනය කඩ කිරීම සම්බන්ධයෙන් කටයුතු කර තිබේද යන කරුණු කාරණා, නීතිඥ ප්‍රජාව විසින් සළකා බලන බවත්, ඒ අනුව නීතිඥ ප්‍රජාව වෙනුවෙන් නායකත්වය දැරිය හැකි ජ්‍යෙෂ්ඨ සහ විශිෂ්ඨ නීතිඥවරයකු නීතිඥවරුන්ගේ නාම යෝජනා ඉදිරිපත් කිරීම සම්ප්‍රදායක් වශයෙන් නීතිඥ වෘත්තියෙහි සිදු කරමින් එන ලද්දක් බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.



CamScanner

ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ 2025 වර්ෂයේ සභාපති ධූරය තෝරා පත්කර ගැනීම සඳහා නිළවරණයට නාම යෝජනා කැඳවීම

13. වර්ෂ 2025 පවත්වන නීතිඥ සංගමයේ නිළවරණයෙහි තේරීම් භාර නිළධාරියා ලෙස (Returning Officer) කටයුතු කරනු ලබන්නේ ශ්‍රී ලංකා ජනරජයේ ගරු සොලිසිටර් ජෙනරාල් තැන්පත් ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න යන ඉහත නම් සඳහන් 5 වන විත්තිකරු වේ.

14. වර්ෂ 2025 දී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති සහ ලේකම් තනතුරු සඳහා නාම යෝජනා වර්ෂ 2025/01/15 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු විය.

15. ඒ අනුව, එම සංගමයේ සභාපති තනතුර සඳහා, නීතිඥ වෘත්තියෙහි ජ්‍යෙෂ්ඨ සහ වෘත්තිමය විශිෂ්ඨත්වයට පත් ජනාධිපති නීතිඥවරයෙකු වන අනුර මැද්දේගොඩ මහතාගේ නම යෝජනා කිරීම සුදුසු බව නීතිඥවරුන් විශාල සංඛ්‍යාවක් සාකච්ඡා කර එකඟත්වයට පැමිණි බවත්, ඒ අනුව, ඉහත නම් සඳහන් 3 වන විත්තිකරු වන ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතාගේ නම, ජනාධිපති නීතිඥවරුන් වන කේ. කනගීෂ්වරන්, ඉක්‍රාම් මොහොඩ්, අනිල් සිල්වා, ජෙෆ්රි අලගරත්නම්, ජගත් වික්‍රමනායක සහ අනුජ ප්‍රේමරත්න විසින් යෝජනා කරන ලද බවත්, එම යෝජනාවන් ජනාධිපති නීතිඥ චන්ද්‍රක ජයසුන්දර, ජනාධිපති නීතිඥ තිසත් විජේගුණවර්න, ජ්‍යෙෂ්ඨ උපදේශක නීතිඥ අනෝමා ගුණතිලක, නීතිඥ ෂෙහාන් ගුණවර්ධන, නීතිඥ බිනර ගුණසේකර සහ නීතිඥ නලින් ද සිල්වා විසින් ස්ථිර කරන ලද බවත්, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

16. ඒ අනුව ජනාධිපති නීතිඥ අනුර මැද්දගොඩ මහතාගේ නාම යෝජනාව සහ ඉහත නම් සඳහන් 01 සහ 02 විත්තිකරුවන්ගේ නාම යෝජනා ද එම නිළවරණයේ තේරීම් භාර නිළධාරීයා වන 05 වන විත්තිකරු විසින් වර්ෂ 2025/01/15 වන දින භාර ගන්නා ලද බවත්, එකී තිදෙනා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා පැවැත්වෙන නිළවරණයෙහි එම ධූරය සඳහා ඉදිරිපත් වන නීතිඥවරුන් තිදෙනා බවට නීතිඥ ප්‍රජාවට දැනුම් දෙන ලද බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි. *05 වන විත්තිකරු විසින් ප්‍රසිද්ධ කරන ලද එකී දැන්වීමෙහි සත්‍ය පිටපතක් " D " ලෙස ලකුණු කර මෙහි කොටසක් ලෙස මේ සමග ඉදිරිපත් කර සිටී.*

17. එසේ නීතිඥ සංගමයේ සභාපති ධූරය සඳහා නාම යෝජනා ඉදිරිපත් කරන ලද 01 වන විත්තිකරු වර්ෂ 2024 දෙසැම්බර් මස නීතිඥ වෘත්තියේ අවුරුදු 20 ක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකු බවත්, 02 වන විත්තිකරු නීතිඥ වෘත්තියේ අවුරුදු 38 ක කාලයක් සම්පූර්ණ

කල නීතිඥවරයෙකු වන බවත් 3 වන විත්තිකරු නීතිඥ වෘත්තියේ අවුරුදු 43 ක කාලයක් සම්පූර්ණ කල ජනාධිපති නීතිඥවරයෙකු වන බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

**18.** ඉහත සඳහන් පරිදි ඉහත නම් සඳහන් 01, 02 සහ 03 වන විත්තිකරුවන්ගේ නාම යෝජනා 05 වන විත්තිකරු විසින් පිළිගැනීමෙන් අනතුරුව එකී තිදෙනා එම පත්වීම සඳහා නීතිඥ ප්‍රජාවගේ සහයෝගය අපේක්ෂා කරමින් කටයුතු කරන්නට වූ බව පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

**19.** ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති ධූරය සඳහා එකී නාම යෝජනා තුන පිලිගත් පසු, ඒ තිදෙනාගේ සුදුසු පුද්ගලයා තෝරා ගැනීමේ හිමිකම නීතිඥ සංගමයේ සාමාජිකයන් වෙත පැවරුණු බවත්, එකී තිදෙනාගෙන් සුදුසුම පුද්ගලයා තෝරා පත්කර ගැනීමේ වරම නීතිඥ සංගමයේ සාමාජිකයන් වෙත හිමි වූ බවත්, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

<u>3 වන විත්තිකරු විසින් නීති විරෝධී සහ අසාධාරණ ලෙස නාමයෝජනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම</u>

***20.*** මෙම නිළවරණය වර්ෂ 2025-02-19 වන දිනට නියම කර ඇති අතර, ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතාගේ නම සභාපති ධූරය සඳහා යෝජනා කල මෙන්ම අනුමත කල නීතිඥ මහතුන්ට නොදන්වා, ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතා විසින් මෙම නිළවරණයට තේරීම් භාර නිළධාරියා වන 5 වන විත්තිකරු වෙත යවන ලද ලිපියක් මුල් කරගෙන ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතාගේ නම 2025-02-19 වන දිනට නියමිත නිළවරණයට අදාල ඡන්ද පත්‍රිකාවෙන් ඉවත් කර ඇති බවට 5 වන විත්තිකරු විසින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ලේකම් වන ඉහත නම් සඳහන් වන 4 වන විත්තිකරු වෙත දක්වා ඇති බවට එකී ලේකම් තුමා වර්ෂ 2025-02-08 වන දින සමස්ථ සාමාජිකයන් වෙත කෙටි පණිවිඩයක් මගින් දන්වා ඇති බවත්, එම කෙටි පණිවිඩයේ *තිර පිටපතක් "**<u>E</u>**" ලෙස ලකුණු කර මෙහි කොටසක් ලෙස ඉදිරිපත් කර සිටින බවත් ජනාධිපති නීතිඥ අනුර මැද්දෙගොඩ මහතා ඔහුගේ මුහුණු පොත් ගිනුම මගින් ඔහුගේ නාමයෝජනාව ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයේ සත්‍ය පිටපතක් "**<u>E1</u>**" ලෙස ලකුණු කර මෙහි කොටසක් ලෙස ඉදිරිපත් කර සිටින බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.*

**21.** ඒ අනුව, නීතිඥ ප්‍රජාව වෙනුවෙන් එම තනතුර සඳහා නාම යෝජනා ඉදිරිපත් කරන ලද ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතාගේ නම ඡන්ද පත්‍රිකාවෙන් 5 වන විත්තිකරු විසින් ඉවත් කිරීම අනීතික බවත්, එසේ ඉවත් කිරීමට තේරීම් භාර නිළධාරියා වන 5 වන විත්තිකරුට හිමිකම් නොමැති බවත්, ඒ මගින් නීතිඥ ප්‍රජාවගේ මෙන්ම පැමිණිලිකාරියගේ නීතිමය හිමිකම් සහ වරප්‍රසාද සාවද්‍ය ලෙස අභිමිකර ඇති බවත්, සහ/හෝ සුදුසු සභාපතිවරයෙක් සිය කැමැත්ත අනුව තෝරා පත් කර ගැනීමට පැමිණිලිකාරිය අතුලු නීතිඥ



CamScanner

ප්‍රජාව සතු හිමිකම ප්‍රොඩාකාරී ලෙස වංක සහයෝගයෙන් යටපත් කර ඇති බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

**22.** නීතිඥ සංගමයේ සභාපති ධූරය සඳහා පවත්වන නිළවරණය සඳහා නාම යෝජනා, තේරීම්භාර නිළධාරීතුමන් වන 05 වන වින්තිකරු විසින් භාරගෙන පිළිගත් පසු, එය වෙනස් කිරීමට හෝ එහි නම් කපා හැරීමට හෝ එකී 05 වන වින්තිකරුහට කිසිදු හිමිකමක් නොමැති බවත්, සහ/හෝ එකී තනතුර සඳහා නාම යෝජනා ඉදිරිපත් කරන ලද අපේක්ෂකවරයෙකුට හෝ වරියකට එකී නාමයෝජනාව ඉල්ලා අස්කිරීමට ද හිමිකමක් නොමැති බවත්, එසේ නාම යෝජනා ඉල්ලා අස්කර ගැනීම සඳහා කිසිදු ප්‍රතිපාදනයක් ව්‍යවස්ථාවේ නොමැති බවත්, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

**23.** ජනාධිපති නීතිඥ අනුර මැද්දෙගොඩ මහතා ඔහුගේ නාම යෝජනාව ඉල්ලා අස්කර ගැනීමේ ඊනියා ක්‍රියා කළාපය හේතුවෙන් වර්ෂ 2025/02/19 වන දිනට පැවැත්වීමට නියමිත නිළවරණයේ දී නීතිඥ ප්‍රජාවට සිය ඡන්දය සළකුණු කිරීම සඳහා ලබා දෙන නිළ ඡන්ද පත්‍රිකාවේ සඳහන් වන නම් කුමක්දැයි නීතිඥ සංගමයේ ලේකම්තුමාගෙන් විමසන ලද බවත්, ලේකම්වරයා එයට පිළිතුරු සපයමින් යවන ලද වට්ස්අප් පණිවිඩය මගින් ප්‍රකාශ කර ඇත්තේ එහි සඳහන් වන්නේ 01 වන සහ 02 වන වින්තිකරුවන්ගේ නම් පමණක් බවයි .

*පැමිණිලිකාරියගේ එකී ඉල්ලීම සහ ලේකම්තැනගේ පිළිතුර අඩංගු වට්ස්අප් පණිවිඩයේ තිර පිටපතක් **"F"** ලෙස ලකුණු කර පැමිණිල්ලේ කොටසක් ලෙස මේ සමග ඉදිරිපත් කර සිටී.*

<u>ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ව්‍යවස්ථාව අනුව නාම යෝජනා භාරදුන් පසුව එම යෝජනාව ඉවත්වුවහොත් නෛතික තත්වය</u>

**24.** පැමිණිලිකාරිය ගෞරවයෙන් ප්‍රකාශකර සිටින්නේ නිළවරණය සඳහා නාම යෝජනා භාරදුන් පසුව සහ නිළවරණය පැවැත්වීමට පූර්වයෙන් යම් අපේක්ෂකයකුගේ නාම යෝජනාව ඉවත් වුවහොත් එමගින් නිළවරණයට නාම යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂාවෙන් සිටි අපේක්ෂකයින්ගේ සහ ඡන්දය භාවිතා කිරීමට අපේක්ෂා කරන ඡන්ද දායකයින්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන්ට බලපෑමක් වන බවය.

**25.** එබැවින් එවැනි අගතියක් සිදුවීම වැළැක්වීමේ අරමුණින් නීතිඥ සංගමයේ ව්‍යවස්ථාවේ **B** උපලේඛණයෙහි **(d)** ඡේදය ප්‍රකාරව සභාපති ධූරයට නාම යෝජනා ඉදිරිපත් කර ඇති තැනැත්තෙකු නිළවරණයට පෙර මියගියහොත් නිළවරණය නොපවත්වා මියගිය අය වෙනුවෙන් තවත් නාම යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා අවසරය ලබා දී ඇති බවත්, නැවත නිළවරණයට නව නාම යෝජනා කැඳවිය යුතු බවටත් පහත පරිදි ප්‍රතිපාදන දක්වා ඇත . එනම්.

*(d) DEATH OF A CANDIDATE, PRESIDENT ELECT OR SECRETARY ELECT*
*1. If after the acceptance of nominations by the Returning Officer but prior to the day of the elections, any candidate for the post of President or*



CS CamScanner

*Secretary dies, the proposed election for the post of President or Secretary, as the case may be, shall not proceed further but fresh nominations shall be called for such post and the provisions of Rule (D) 4 herein after contained shall apply.*

*2. If on the day of the elections but prior to the declaration of the results by the Returning Officer, any candidate for the post of President or Secretary dies, the Returning Officer shall proceed with the elections and the counting of votes. If the deceased candidate polls the highest number of votes, the Returning Officer shall not declare the result of such election. In such an event, fresh nominations shall be called for such post and the provisions of the said Rule (D) 4 shall apply.*

*3. If after the declaration of the results by the Returning Officer of the election of the President and Secretary but prior to the installation of the President elect as the President and to the assumption of office by the Secretary elect as the Secretary at the Annual Convocation, any one of them dies, the post of President or Secretary, as the case may be, shall be deemed to be vacant and fresh nominations shall be called for such post and the provisions of the said Rule (D) 4 shall apply.*

*4. In the event of the death of any candidate for the post of President or Secretary or of the President elect or Secretary elect fresh nominations shall have to be called for, followed by an election, notwithstanding anything to the contrary contained in any Article of the Constitution or in any other Rule in Schedule "B" thereto, the date of such nominations shall be within ten days from the date of such death and the date of such election shall be within twenty one days from the date of such nominations. Subject to the aforesaid, the Nomination and Election Procedure – Rules contained in schedule "B" to the Constitution shall mutatis mutandis apply to the said nominations and election.*

**26.** එමගින් පෙනී යන්නේ නාම යෝජනා ඉදිරිපත් කිරීම සහ එහි බලපෑම නාම යෝජනා ඉදිරිපත් කර ඇති පුද්ගලයාට පමණක් සීමා නොවන බවත්, එකී සභාපති ධූරයට ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ලැබූ සම්පූර්ණ නීතීඥ ප්‍රජාව වෙත ඔවුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් බලපාන කරුණක් බවත්, එසේ ඡන්දය පාවිච්චි කිරීමට හිමි නීතීඥ ප්‍රජාවගේ මනාපය නොවිමසා සභාපති ධූරය සඳහා එවැනි අවස්ථාවන්හිදී නිළවරණයක් පැවැත්වීම නුසුදුසු සහ/හෝ සාවද්‍ය ක්‍රියාවක් බවත්, එය පැමිණිලිකාරිය ඇතුලු සමස්ථ නීතිඥ ප්‍රජාව සතු නීතිඥ සංගමයේ සභාපති තෝරා ගැනීමේ අයිතිවාසිකම සහ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම බලවත් ලෙස යටපත් වන බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

**27.** තව ද, නිසි නිළවරණයකින් පසු තෝරා පත් වූ සභාපතිවරයකු සිය සභාපතිත්වය භාරගැනීමට පෙර මිය යන්නට වුවහොත්, එවැනි අවස්ථාවක දී පවා අලුත් නිළවරණයක්

පවත්වා නීතිඥ ප්‍රජාව විසින් සිය සභාපතිවරයා තෝරා පත් කරගත යුතු බවට මෙම සංගමයේ ව්‍යවස්ථාව මගින් සඳහන් කර තිබීම ද, මගින් තහවුරු වී ඇත්තේ ඡන්දය පාවිච්චි කිරීමට සෑම නීතිඥවරයෙකුටම සිය සභාපතිවරයා තෝරා ගැනීමට ඇති අයිතිය උත්තරීතර අයිතියක් බවත්, නිළවරණය සඳහා ඉදිරිපත් වූ පුද්ගලයා මිය ගියේ නම් වුව ද එම උත්තරීතර අයිතියට හානි නොවන පරිදි අලුතෙන් නාම යෝජනා කැඳවා නිසි පරිදි නිළවරණයක් පැවැත්විය යුතු බවය.

**28.** ඉහත සඳහන් පරිදි ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතා හට ඔහුගේ නාම යෝජනාව ඉල්ලා අස්කර ගැනීමට හිමිකම් නොමැති බවත්, නාම යෝජනා පිලිගැනීමෙන් පසු, පිළිගත් අපේක්ෂකයා වෙනුවෙන් හෝ ඔහුට විරුද්ධව ඡන්දය පාවිච්චි කිරීමේ පරම හිමිකම නීතිඥ සංගමයේ සෑම සාමාජිකයෙකුටම පැවරී ඇති බවත්, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

**29.** මෙම නිළවරණයෙහි තේරීම්භාර නිළධාරියා වන 05 වන විත්තිකරු විසින්, සභාපති ධුරය සඳහා පිළිගත් අපේක්ෂකයකු වූ ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතාගේ නාමයෝජනාව නිළ ඡන්ද පත්‍රිකාවෙන් ඉවත් කිරීමට ගෙන ඇති තීරණය නීතිඥ සංගමයේ ව්‍යවස්ථානුකූලව සිදු වූ මරණයක් සේ සැළකිය යුතු සහ/හෝ ඒ හා සමාන ක්‍රියාවක් බවත්, නොඑසේ නම් එසේ එකී අපේක්ෂකයගේ නම නිළ ඡන්ද පත්‍රිකාවෙන් ඉවත් කිරීම මගින් නීතිඥ ප්‍රජාවගේ මෙන්ම පැමිණිලිකාරියගේ අයිතිවාසිකම් සම්පූර්ණයෙන් අනීතිකව යටපත් වන බවත්, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

***30.*** ජනාධිපති නීතිඥ චන්ද්‍රක ජයසුන්දර මහතා මෙම නිළවරණයෙහි නීතිඥ සංගමයේ සභාපති ධුරයට තරග කිරීම සඳහා ඉදිරිපත් වන බවට නීතිඥ ප්‍රජාවට දැනුම් දුන් නමුත්, ඔහුට වඩා ජ්‍යේෂ්ඨ නීතිඥවරයෙකු වන ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතා මෙම නිළවරණය සඳහා ඉදිරිපත් වන බවට ප්‍රකාශ කරන ලද බැවින්, නීතිඥ වෘත්තියෙහි අවුරුදු 43ක කාලයක් කටයුතු කළ ජ්‍යේෂ්ඨ ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතා මෙම නිළවරණයට ඉදිරිපත් වීමට ඉඩකඩ සැළසිය යුතු බවට ප්‍රකාශ කරමින්, ඔහු එම තනතුර සඳහා නාම යෝජනා ඉදිරිපත් නොකිරීමට තීරණය කරන ලද බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

***31.*** ජනාධිපති නීතිඥ චන්ද්‍රක ජයසුන්දර මහතා මෙම නිළවරණයට ඉදිරිපත් වන බවට නීතිඥ ප්‍රජාවට 2024-11-18 වන දින පුවත් පත මගින් කරන ලද දැන්වීමේ සත්‍ය පිටපතක් **<u>"F1"</u>** *ලෙස ද, ඉන්පසුව ජනාධිපති නීතිඥ අනුර මැද්දෙගොඩ මහතා ඉදිරිපත් වීම මත, ඔහුට වඩා ජ්‍යේෂ්ඨ නීතිඥවරයෙකු ඉදිරිපත්වීම හේතු කොට ගෙන වෘත්තියේ උසස් සම්ප්‍රදායන්ට අනුව ජනාධිපති නීතිඥ චන්ද්‍රක ජයසුන්දර මහතා එම නිළවරණයට ඉදිපත් නොවන බවට කරන ලද වට්ස්අප් කෙටි පණිවුඩය මගින් කරන ලද දැනුම්දීමෙහි සත්‍ය පිටපතක්* **<u>"F2"</u>** *ලෙස ද, ලකුණු කර ඒවා මෙම පැමිණිල්ලේ කොටස් ලෙස මේ සමග ඉදිරිපත් කර සිටී.*



CamScanner

32. එසේ වෙනත් ජේෂ්ඨ මෙන්ම වෘත්තිමය විශිෂ්ඨත්වයට පත් ජනාධිපති නීතිඥවරයෙකු එම සභාපති තනතුර සඳහා නාම යෝජනා ඉදිරිපත් කරවීමට පැමිණිලිකාරිය හා නීතිඥ ප්‍රජාව සතු අයිතිවාසිකම යටපත් කරමින් ජනාධිපති නීතිඥ අනුර මැද්දෙගොඩ මහා විශාල නීතිඥ කොටසකගේ ඉල්ලීම අනුව එම සභාපතිධූරය සඳහා නාම යෝජනා ඉදිරිපත් කොට ඉන් පසු කුමන හෝ හේතුවක් මත ඉල්ලා අස් කර ගැනීමේ අනීතික ක්‍රියා කලාපය හේතුගොටගෙන, පැමිණිලිකාරියට මෙන්ම නීතිඥ සංගමයේ අනෙකුත් සාමාජිකයන්ට එම තනතුර සඳහා සුදුසු ජ්‍යෙෂ්ඨ වෘත්තිය විශිෂ්ඨකත්වයට පත් ජනාධිපති නීතිඥවරයකු පත් කර ගැනීමට තිබුණු හිමිකම හෝ වරප්‍රසාදය ජනාධිපති නීතිඥ මැද්දෙගොඩ මහතාගේ එකී සාවද්‍ය ක්‍රියා කලාපය මගින් අහිමි කර ඇති බව පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටි.

33. නීතිඥ සංගමයේ සභාපති ධූරය සඳහා ජේෂ්ඨ සහ විශිෂ්ඨත්වයට පත් නීතිඥවරුන් සිටිය යුතු බවත්, එම ධූරය සඳහා අවම වශයෙන් අවුරුදු 20 ක් හෝ නීතිඥ වෘත්තියේ සිටිය යුතු බවට නීතිඥ සංගමයේ ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති බවත් එබැවින් වඩාත් ජ්‍යෙශ්ඨ හෝ වෘත්තිමය විශිෂ්ඨත්වයට පත් වූ නීතිඥවරුන් මෙම උත්තරීතර තනතුර සඳහා ඉදිරිපත් වීම මෙම ව්‍යවස්ථාව මගින් අපේක්‍ෂා කරන ලද්දක් නොවන බවත්, එම තනතුරේ කාර්‍යයන් හා වගකීම් ඉටු කිරීම සඳහා ජ්‍යෙශ්ඨ සහ විශිෂ්ඨත්වයට පත් නීතිඥ වරයෙකු වීම අත්‍යවශ්‍ය බවත් ය.

34. මෙම අත්‍යවශ්‍යතාවය, ප්‍රභල ලෙස මතුවූ මෑත කාලීනව ශ්‍රී ලංකා නීතිඥ සංගමය ආශ්‍රිතව සිදුවූ ගැටළුවක් වන JICA (ජයිකා) ආයතනය මගින් නීතිඥ සංගමයෙන් අපේක්ෂිත ව්‍යාපෘතියකට අදාළව ගෙවන ලද මුදල් සම්බන්ධයෙන් පැන නැගුන ආන්දෝලනාත්මක සිද්ධීන් පිළිබඳව කරුණු සොයා බලා වාර්තා කිරීමට පත් කරන ලද නීතිඥ වෘත්තියේ ඉතා ජ්‍යෂ්ඨ ජනාධිපති නීතිඥවරුන් පස් දෙනෙකු වන ජනාධිපති නීතිඥ ආචාර්ය ෆායිස් මුස්තාපා මහතා, ආචාර්ය ජනාධිපති නීතිඥ කේ. කනගීස්වරන් මහතා, ජනාධිපති නීතිඥ ඉක්‍රාම් මොහොමඩ් මහතා, ජනාධිපති නීතිඥ රියන්සි අර්සකුලරත්න මහතා සහ ජනාධිපති නීතිඥ ජෙෆ්රි අලගරත්න මහතාගෙන් සමන්විත කමිටුව විසින් නීතිඥ සංගමයට ඉදිරිපත් කරන ලද වාර්තාව මගින්ද තහවරු කර ඇති බවත්, *එකී වාර්තාවේ සත්‍ය පිටපතක්* ***<u>"G"</u>*** *ලෙස ලකුණු කර පැමිනිල්ලේ කොටසක් ලෙස මේ සමග ඉදිරිපත් කර සිටි.*

35. එකී වාර්ථාවේ අනෙකුත් කරුණු අතර, එකී වාර්තාවේ අවසාන සටහන් ලෙස (Concluding Remarks) ලෙස පහත සඳහන් මූලික කරුණු තුනක් සටහන් කර ඇති බව පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටි.

<u>Concluding Remarks:</u>

**<u>President of the Bar Association of SriLanka</u>**



CamScanner

A. This episode brings to the forefront the position of the President of the BASL. He, by virtue of Office, is considered the Leader of the Bar. He is respected for his integrity, objectivity and as someone who has already established himself as a leader in the profession. He is called upon, if not persuaded, to render a service to the legal profession by sacrificing some of his professional time to serve the larger interests of the Bar.

B. He must be seen as the face and voice of the profession to whom its members proudly lookup as a worthy leader/ representative. He should be able to command the respect and have the capacity and ability to havea one-on-one relationship with key stakeholders in the justice and administrative system such as the Chief Justice, Members of the Judiciary, Attorney General, President of the Republic, Prime Minister, Minister of Justice and other senior government officials, among others.

c. The President, at the least, should be someone persuaded to lead and not someone pursuing this role through mere popularity or popular vote.

**36.** එම වාර්ථාව නීතිඥ සංගමයේ නීතිඥ සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලද වාර්තාවක් බවද පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

**37.** ඉහත සඳහන් කරුණු අනුව, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටින්නේ, වර්ෂ 2025-02-19 වන දිනට නියමිත නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා පැවැත්වෙන නිළවරණයෙන් ඉල්ලා අස්වීමට 3 වන විත්තිකරු වන ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතාට හිමිකම් නොමැති බවත්, සහ/හෝ එකී ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතාගේ නම එදිනට පැවැත්වීමට නියමිත නිළවරණයේ ජන්ද පත්‍රිකාවේ ඇතුලත් නොකිරීම නීත්‍යානුකූල නොවන බවත්, සහ/හෝ අනුර මැද්දේගොඩ මහතාගේ නම එකී ජන්ද පත්‍රිකාවෙන් ඉවත් කල හොත් අලුතින් නාම යෝජනා කැඳවීම 5 වන විත්තිකරු විසින් සිදු කල යුතු බවත්, සහ/හෝ දැනට 5 වන විත්තිකරු විසින් ඉහත නම් සඳහන් 1 වන සහ 2 වන විත්තිකරුවන්ගේ නම් පමණක් අඩංගු ජන්ද පත්‍රිකා මත වර්ෂ 2025-02-19 වන දින නිළවරණය පැවැත්වීමට 5 වන විත්තිකරුට හිමිකම් නොමැති බවත්ය.

**38.** ඉහත සඳහන් කරුණු අනුව, වර්ෂ 2025-02-19 වන දිනට නියමිත ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිළවරණය අවලංගු කරගැනීමට සහ/හෝ ජනාධිපති නීතිඥ අනුර මැද්දේගොඩ මහතා වෙනුවට සුදුසු ජ්‍යේෂ්ඨ නීතිඥ මහතෙකුගේ නම යෝජනා කිරීම සඳහා පැමිණිලිකාරිය ඇතුලු නීතිඥ ප්‍රජාවට හිමිකම් සතු බවත් එබැවින් නිළවරණය නවත්වන ලෙසට 5 වන විත්තිකරුට වර්ෂ 2025.02.17 දිනැතිව ලිපියක් යොමුකරමින් ඉල්ලා සිටි බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී. එකී ලිපියේ සත්‍ය පිටපතක් *පිටපතක්* ***"H"*** *ලෙස ලකුණු කර මේ සමග ඉදිරිපත්කර අයැද සිටී.*



CamScanner

**39.** ඉහත සඳහන් කරුණු අනුව පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටින්නේ,

(අ) මෙම නඩුවේ පාර්ශවකරුවන් කර නොමැති ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සියලු සාමාජිකයින්ද, නීතිඥ සංගමයේ විධායක සභාවේ සාමාජිකයන්ද, නීතිඥ සංගමයේ ශාඛා සංගම් වල සාමාජිකයන්ද, මෙම නඩුවේ නියෝජනය කිරීම වස් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ලේකම්වරයා වන ඉහත නම් සඳහන් 4 වන විත්තිකරුව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 16 වන වගන්තිය යටතේ පත්කර, එම පත්කිරීම අදාල පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා අවශ්‍ය නියෝගයක් නිකුත්කරවා ගැනීමටත්,

(ආ) ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති සහ/හෝ ලේකම් තනතුර සඳහා නිළවරණය සඳහා නාම යෝජනා භාර ගැනීමෙන් අනතුරුව සහ නිළවරණය පැවැත්වීමට පූර්වයෙන් අපේක්ෂකයකු මියයාමෙන් හෝ නාම යෝජනාව ඉවත්කර ගැනීමෙන් අපේක්ෂක නාමාවලිය වෙනස් වුවහොත් නැවත අළුතින් නාමයෝජනා කැඳවීමෙන් තොරව නිළවරණය පැවැත්වීම මගින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ව්‍යවස්ථාව උල්ලංඝණය වන බවට තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ලබා ගැනීමටත්,

(ඇ) වර්ෂ 2025-02-19 වන දිනට නියමිත ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා නිළවරණයට ඉදිරිපත් කර ඇති නාම යෝජනාව ඉල්ලා අස්කර ගැනිමට 3 වන විත්තිකරුට හිමිකම් නොමැති බවට සහ/හෝ 1 සහ 2 වන විත්තිකරුවන්ගේ නාම යෝජනා සහිතව 2025/2026 වර්ෂය සඳහා එම සභාපතිධූරය සඳහා නිළවරණයක් පැවැත්විය නොහැකි බවට තීන්දු කර තීන්දු ප්‍රකාශයක් ලබා ගැනිමටත්,

(ඈ) 3 වන විත්තිකරුගේ නම වර්ෂ 2025/2026 සඳහා පවත්වන ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා වන නිළවරණයෙහි නිළ ජන්ද පත්‍රිකාවේ ඇතුලත් නොකිරීම නීත්‍යානුකූල නොවන බවට තීන්දු කර තීන්දු ප්‍රකාශයක් ලබා ගැනිමටත්,

(ඉ) 3 වන විත්තිකරුගේ නම වර්ෂ 2025/2026 ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා පවත්වන නිළවරණයෙහි නිළ ජන්ද පත්‍රිකාවෙන් ඉවත් කල හොත් හෝ 3 වන විත්තිකරු සිය නාමයෝජනාව ඉල්ලා අස් කර ගත හොත් අලුතින් නාම යෝජනා නොකැඳවා 5 වන විත්තිකරුට එම නිළවරණය පැවැත්විය නොහැකි බවට තීන්දු කර තීන්දු ප්‍රකාශයක් ලබා ගැනීමටත්,



CamScanner

(ඊ) 5 වන විත්තිකරු විසින් ඉහත සඳහන් 1 වන සහ 2 වන විත්තිකරුවන්ගේ නම් පමණක් ඇතුලත් කරන ලද නිල ඡන්ද පත්‍රිකාව මත වර්ෂ 2025/2026 සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා වන නිලවරණය පැවැත්වීමට 5 වන විත්තිකරුට හිමිකම් නොමැති බවට තීන්දු කර තීන්දු ප්‍රකාශයක් ලබා ගැනීමටත්,

(උ) අලුතින් නාම යෝජනා කැඳවීමකින් තොරව වර්ෂ 2025/2026 සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිලවරණය වර්ෂ 2025-02-19 වන දින හෝ වෙනත් දිනකයක පැවැත්වීමෙන් 5 වන විත්තිකරු සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ සේවකයන් වළක්වාලන ස්ථිර ඉංජන්ෂන් තහනම් නියෝගයක් ලබා ගැනීමටත්,

(ඌ) අලුතින් නාම යෝජනා කැඳවීමකින් තොරව වර්ෂ 2025/2026 සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිලවරණය වර්ෂ 2025-02-19 වන දින හෝ වෙනත් දිනකයක පැවැත්වීමෙන් 5 වන විත්තිකරු සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ සේවකයන් වළක්වාලන අතුරු ඉංජන්ෂන් තහනම් නියෝගයක් ලබා ගැනීමටත්,

(එ) අලුතින් නාම යෝජනා කැඳවීමකින් තොරව වර්ෂ 2025/2026 සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිලවරණය වර්ෂ 2025-02-19 වන දින හෝ වෙනත් දිනකයක පැවැත්වීමෙන් 5 වන විත්තිකරු සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ සේවකයන් වළක්වාලන අතුරු ඉංජන්ෂන් තහනම් නියෝගයක් ලබා දෙන තෙක් වාරණ නියෝගයක් ලබා ගැනීමටත්,

1, 2, 3, 4 සහ 5 වන විත්තිකරුවන්ට විරුද්ධව එක්ව සහ/හෝ වෙන් වෙන්ව නඩු පැවරීමට පැමිණිලිකාරියට වර්ෂ 2025/02/13 වන දින හෝ ඊට ආසන්න දිනක නඩු නිමිත්තක් හටගෙන ඇති බවත්ය.

**40.** ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා නිලවරණය වර්ෂ 2025-02-19 වන දිනට පැවැත්වීමට නියමිත බැවින් එම නිලවරණය මෙම නඩුව විභාග කර තීන්දු කරන තෙක් අතුරු තහනම් නියෝගයක් මගින්ද, එතෙක් වාරණ නියෝගයක් මගින්ද, තහනම් කර වලක්වාලීම අත්‍යවශ්‍ය බවත්, නොඑසේ නම් මෙම නඩුවේ අපේක්ෂිත සහන නිෂ්ඵල තත්වයට පත්වන බවත්, සහ/හෝ පැමිණිලිකාරිය ඇතුලු නීතිඥ ප්‍රජාව සතු අයිතිවාසිකම් අප්‍රතිකාර්‍ය ලෙස හානියට පත්වන බවත්, පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටි.

**41.** මුද්දර ගාස්තු සඳහා මෙම නඩුවේ විෂය වස්තුවේ වටිනාකම රුපියල් මිලියන 50 ක් ලෙස තක්සේරු කර සිටි.



CamScanner

සැලකූ එසේ හෙයින් පැමිණිලිකාරිය විසින් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඇයැද සිටින්නේ,

(අ) මෙම නඩුවේ පාර්ශවකරුවන් කර නොමැති ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සියලු සාමාජිකයින්ද, නීතිඥ සංගමයේ විධායක සභාවේ සාමාජිකයන්ද, නීතිඥ සංගමයේ ශාඛා සංගම් වල සාමාජිකයන්ද, මෙම නඩුවේ නියෝජනය කිරීම වස් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ලේකම්වරයා වන ඉහත නම් සඳහන් 4 වන විත්තිකරුව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 16 වන වගන්තිය යටතේ පත්කර, එම පත්කිරීම අදාල පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා අවශ්‍ය නියෝග නිකුත් කරන මෙන්ද.

(ආ) ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති සහ/හෝ ලේකම් තනතුර සඳහා නිලවරණය සඳහා නාම යෝජනා භාර ගැනීමෙන් අනතුරුව සහ නිලවරණය පැවැත්වීමට පූර්වයෙන් අපේක්ෂකයකු මියයාමෙන් හෝ නාම යෝජනාව ඉවත්කර ගැනීමෙන් අපේක්ෂක නාමාවලිය වෙනස් වුවහොත් නැවත අළුතින් නාමයෝජනා කැඳවීමෙන් තොරව නිලවරණය පැවැත්වීම මගින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ව්‍යවස්ථාව උල්ලංඝණය වන බවට තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ලබා දෙන ලෙසත්,

(ඇ) වර්ෂ 2025-02-19 වන දිනට නියමිත ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා නිලවරණයට ඉදිරිපත් කර ඇති නාම යෝජනාව ඉල්ලා අස්කර ගැනීමට 3 වන විත්තිකරුට හිමිකම් නොමැති බවට සහ/හෝ 1 සහ 2 වන විත්තිකරුවන්ගේ නාම යෝජනා සහිතව 2025/2026 වර්ෂය සඳහා එම සභාපතිධූරය සඳහා නිලවරණයක් පැවැත්විය නොහැකි බවට තීන්දු කර තීන්දු ප්‍රකාශ ගත කරන මෙන්ද,

(ඈ) 3 වන විත්තිකරුගේ නම වර්ෂ 2025/2026 සඳහා පවත්වන ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා වන නිලවරණයෙහි නිල ඡන්ද පත්‍රිකාවේ ඇතුලත් නොකිරීම නීත්‍යානුකූල නොවන බවට තීන්දු කර තීන්දු ප්‍රකාශ ගත කරන මෙන්ද,

(ඉ) 3 වන විත්තිකරුගේ නම වර්ෂ 2025/2026 ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා පවත්වන නිලවරණයෙහි නිල ඡන්ද පත්‍රිකාවෙන් ඉවත් කල හොත් හෝ 3 වන විත්තිකරු සිය නාමයෝජනාව ඉල්ලා අස් කර ගත හොත් අලුතින් නාම යෝජනා නොකැඳවා 5 වන විත්තිකරුට එම නිලවරණය පැවැත්විය නොහැකි බවට තීන්දු කර තීන්දු ප්‍රකාශ ගත කරන මෙන්ද,

(ඊ) 5 වන විත්තිකරු විසින් ඉහත සඳහන් 1 වන සහ 2 වන විත්තිකරුවන්ගේ නම් පමණක් ඇතුලත් කරන ලද නිල ඡන්ද පත්‍රිකාව මත වර්ෂ 2025/2026 සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිධූරය සඳහා වන නිලවරණය පැවැත්වීමට 5 වන විත්තිකරුට හිමිකම් නොමැති බවට තීන්දු කර තීන්දු ප්‍රකාශ ගත කරන මෙන්ද.



Scanned with CamScanner

CamScanner

(උ) අලුතින් නාව යෝජනා කැඳවීමකින් තොරව වර්ෂ 2025/2026 සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිළවරණය වර්ෂ 2025-02-19 වන දින හෝ වෙනත් දිනකයක පැවැත්වීමෙන් 5 වන විත්තිකරු සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ සේවකයන් වළක්වාලන ස්ථිර ඉංජන්ෂන් තහනම් නියෝගයක් ලබා දෙන ලෙසත්,

(ඌ) අලුතින් නාම යෝජනා කැඳවීමකින් තොරව වර්ෂ 2025/2026 සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිළවරණය වර්ෂ 2025-02-19 වන දින හෝ වෙනත් දිනකයක පැවැත්වීමෙන් 5 වන විත්තිකරු සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ සේවකයන් වළක්වාලන අතුරු ඉංජන්ෂන් තහනම් නියෝගයක් ලබා දෙන ලෙසත්,

(එ) අලුතින් නාම යෝජනා කැඳවීමකින් තොරව වර්ෂ 2025/2026 සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිළවරණය වර්ෂ 2025-02-19 වන දින හෝ වෙනත් දිනකයක පැවැත්වීමෙන් 5 වන විත්තිකරු සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ සේවකයන් වළක්වාලන අතුරු ඉංජන්ෂන් තහනම් නියෝගයක් ලබා දෙන තෙක් වාරණ නියෝගයක් ලබාදෙන ලෙසත්,

(ඒ) ඉහත (ඌ) ආයාචනයේ පරිදි විත්තිකරුවන් වෙත අතුරු ඉංජන්ෂන් තහනම් නොතිසි නිකුත්කරන ලෙසත්,

(ඔ) නඩු ගාස්තු සහ

(ඕ) මෙම ඇධිකරණයට සුදුසු හා මැනවැයි පෙනී යන වෙනත් සහ වැඩිමනත් සහනයන් ලබා දෙන ලෙසත් ය.

පැමිණිලිකරුගේ ලේඛණගත නීතිඥවරුන්

MALLAWARACHCHI ASSOCIATES
Attorneys-at-Law & Notaries Public
20/1, Belmont Street,
Colombo - 12, Sri Lanka
Tel: +94112 455572
Fax: +94112 399635



CamScanner